# ශ්‍රී ලංකාවේ පැරණි පුස්කොල පොත් නිර්මාණයෙහි සංඛ්‍යා භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

එච්.ඩී. තරංගනී

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
dinethrahd@gmail.com

ප්‍රමුඛ පදඃ පුස්කොල පොත, තල්පත, සංඛ්‍යා, අක්ෂර, අංකනය

**හැඳින්වීම**

සන්නිවේදනය අරමුණු කරගත් ශ්‍රී ලංකාවේ ලේඛන කලාවට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. එය අනුරාධපුර ඇතුල්නුවර කරන ලද කැණීම් තුළින් හමු වූ සාධක මත අදින් වසර 2500 කට පෙර එනම් ක්‍රි.පූ. 600-500 දී පමණ සිදුව ඇතැයි සිරාන් දැරණියගල විසින් සනාථ කර ඇත. මෙම ලේඛනය සඳහා මාධ්‍යය ගණනාවක් කාලීනව යොදා ගත් බව පෙනේ. ඒ අනුව ගල්තලය, ලෝහ තලය, පුස්කොල, දැව (ලී), රෙදි, කඩදාසි යනාදිය භාවිතා කර ඇත. මෙම මාධ්‍යය අතරින් තල් සහ තල කොල භාවිතයෙන් සිදු කරන පුස්කොල පොත් ලේඛන කලාව සුවිශේෂ වේ. ශ්‍රී ලංකාවේ මධ්‍යම වයඹ නැගෙනහිර මෙන්ම බස්නාහිර පලාත ආශ්‍රිතව ද තල් ගස දැක ගත හැකි වුව ද ඉන් තල්පත් නිර්මාණය කරනුයේ සීමිත ප්‍රදේශයකය. මෙම තල්පත නිවැරදිව සකසා ගැනීමෙන් පසුව අක්ෂර සටහන් කරයි. එය පුස්කොළ පොත ලෙස ව්‍යවහාර කරනු ලබයි. මෙම පුස්කොල පොතෙහි පිටු නිවැරදිව එකිනෙක අමුණා ගැනීමේ දී සිදු වන මගහැරවීම් වළක්වා ගැනීමට අංකන ක්‍රමවේදයක් භාවිත කර ඇත. මෙම පර්යේෂණය තුළින් අපේක්ෂා කරනුයේ ශ්‍රී ලංකාවේ පැරණි පුස්කොල පොත් නිර්මාණයේ දී භාවිතයට ගන්නා ලද එවැනි පිටු අංකන ක්‍රමයන් පිළිබඳව විමසා බැලීමයි. එම අංකන ක්‍රමවේදය නූතන හින්දු අරාබි ඉලක්කම්වලින් බැහැරව අක්ෂර භාවිතයක් පිළිබඳව හෙළි කරනු ලබයි. මේ අනුව ශ්‍රී ලංකාවේ පැරණි පුස්කොල පොත් නිර්මාණයන්හි භාවිතයට ගනු ලැබූ අංකනයේ ස්වරූපය කෙසේ ද? යන්න පර්යේෂණ ගැටළුව බවට පත් වේ.

**ක්‍රමවේදය**

පර්යේෂණ ක්‍රමවේදය ලෙස ද්විතියික මූලාශ්‍රයන්ය. පුස්තකාල පොත් භාවිතය තුළින් පුස්කොළ පොතෙහි ආරම්භය , නිර්මාණ ක්‍රමවේදය පිළිබඳව තොරතුරු අධ්‍යයනය කරන ලදි. පුස්කොළ පොතෙහි අංකන ක්‍රමවේදය සොයා බැලීම සඳහා පැරණි පුස්කොල පොත් ගබඩාවන් කෙරෙහි අවධානය යොමු විය. කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලයෙහි පුස්කොළ පොත් පරිශ්‍රීලනය කරන ලදියි. පැරණි ග්‍රාමීය විහාරස්ථාන කිහිපයකම සුරක්ෂිතව ඇති බණ පොත් සහ වෙද පොත් අධ්‍යයනයට යොමු විය. පාරම්පරික හෙළ වෙදකම සිදු කරන වෙදදුරන් සහ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් සිදු කරන ඇදුරන් සතු පුස්කොළ පොත් පිළිබඳව අවධානය යොමු විය. එමෙන්ම පැරණි අංකන ක්‍රමවේදයන් පිළිබඳව ක්ෂේත්‍රයේ උගතුන් සමග සම්මුඛ සාකච්ඡා ද පැවැත්වීමට සිදු විය. මේ අනුව වෛද්‍ය ශාස්ත්‍රය , ගුප්ත විද්‍යාව , බෞද්ධාගමික පොත් යනා දී

පුස්කොළ පොත්හි අංකනය කර ඇති ආකාරය අධ්‍යයනයෙන් පර්යේෂණය සිදු කරන ලදියි.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

දීර්ඝ ඓතිහාසික පසුබිමකින් යුත් පුස්කොළ පොත් ලේඛන කලාව ක්‍රි.පූ. යුගය දක්වා ඈතට ගමන් කරයි. මේ පිළිබඳව සාහිත්‍යගත සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර රැසකින් තොරතුරු අනාවරණය කරයි. මහාවංස කතුවරයා වළගම්බා රජ දවස මාතලේ අළුවිහාරයේ දී සිදු කල ත්‍රිපිටක ග්‍රන්ථාරූඪකරණයක් පිළිබඳව තොරතුරු හෙළි කරයි. වසභ රජ දවස (ක්‍රි.ව.126-170)තොරතුරු ඇතුලත් වල්ලිපුරම් රන් සන්නස සහ පුස්කොළ පොත් ලේඛනය අතර සම ලක්ෂණ දක්නට ලැබේ. රන්පතෙහි ලිවීම සඳහා පන්හිඳක් භාවිත කිරීමත් අක්ෂරයන්හි පවතින සමානතාවත් ලේඛනය ආරම්භයේ ''සිධ'' යන ආශිර්වාදය භාවිතයත් මෙම සමානතා අතර වේ.ලංකාවේ පැරණි ආදායම් වාර්තා තැබීම් පිළිබඳ සාධක ද සෙල්ලිපි ආශ්‍රිතව හමුවෙයි. මිහින්තලේ ශිලා ලිපියට අනුව දිනපතා අයවැය පඤ්චිකා පුස්තකයක සටහන් කර තැබූ බව කියයි. මෙවැනි පුස්කොළ පොත් නිර්මාණකරුවන් පිළිබඳව වැදගත් තොරතුරක් සුනේත්‍රා දේවී පිරිවෙන් ශිලා ලේඛනයෙන් හෙළි වේ. එහි ත්‍රිපිටකයෙන් මසකට ග්‍රන්ථ 1700 බැගින් ලියන ලියන්නන්ට කරනු ලැබූ දීමනාවක් පිළිබඳ තොරතුරු ගෙන එයි. මෙලෙස මූලාශ්‍රය මඟින් විවිධ තොරතුරු හෙළි කළ ද දැනට ලංකාවෙන් හමු වූ පැරණිම තල්පත 13 වැනි සියවසට අයත්ය.

මෙම තල්පතෙහි සඳහන් කරනු ලබන අක්ෂර මෙන්ම සංඛ්‍යා ද වැදගත් කාර්යයක් ඉටු කරනු ලබයි. ඒ අනුව මෙම සංඛ්‍යා යොදා ගනුයේ තල්කොළ එකිනෙකට අමුණා ගැනීමේ දී නිවැරදිව පිටු අංක පිළිවෙලට ගොනු කර ගැනීම සඳහාය.

පුස්කොළ පොතෙහි අංක යෙදීම සිදු කරනුයේ පිටු ගණන මත පදනම්වය. ඒ අනුව එක් කොලයකට (පැති දෙකට) එක් අංකයකි. අක්ෂර ලිවීමට පෙර මෙම පිටු අංකය යොදන අතර පත් ඉරුවේ වම් කෙලවරෙහි එය සටහන් කරයි. ඇතැම් අවස්ථාවල තල්පත් ඉරුවේ වම් කෙලවරෙහි ඉහල ද , තවත් අවස්ථාවක වම් කෙලවර මධ්‍යයෙහි ද අංකනය කල අවස්ථා හමුවේ.

මෙම අංක භාවිතයේ ක්‍රම දෙකක් ඇත. එය එක් අක්ෂරයක් භාවිතා කරමින් අංකනය කිරීම සහ වචනයෙන් අංක යෙදීමයි. අක්ෂර භාවිතා කිරීමේ දී සිංහල හෝඩියේ ස්වර අක්ෂර 14 ත් අනුස්වාරය සහ විසර්ගය සමග අක්ෂර 16 ක් ද ව්‍යඤ්ජන අක්ෂර 34 සමග එකතු කර අක්ෂර 544ක් නිර්මාණය කර ගනියි. පිටු ගණන 544 ඉක්ම වූ අවස්ථාවේ දී '**ද්වි**' යන්න මුලට යොදයි. අංක 1088 ඉක්ම වූ කළ '**ත්‍රි**' යන්න මුලට යොදයි. මෙහි එක් අක්ෂරයක අවසානයේ දී එම අක්ෂරයටම '**ම්**' එක් කර නැවත ඊළඟ අක්ෂරය සටහන් කරයි. (....**කෝ , කෞ ,කම් , බ , බා**....) අංකනය සඳහා ලිත් හෝඩිය ද භාවිතා කර ඇත .එහි දී '' **න ජ ද ර** '' යන අකුරු පිල්ලම් කිහිපයක් සමග භාවිතා කර 0-9 දක්වා අංක සකසා ගෙන ඇත.

වචනවලින් අංක දැක්වීමේ දී ස්වර , ගොළු ව්‍යඤ්ජන (**ම් , ත්**) සහ '**අ**' කාරය නොමැති සංයුතාක්ෂර වලංගු නොවේ. මෙම ක්‍රමය තුළ දී අර්ථවත් වාක්‍යය ද හමු වෙයි. මෙ මඟින් අංකයක් දිනයක් හෝ ගණනක් වාක්‍යයක් ලෙස ඉදිරිපත් කිරීමට හැකි වේ. ව්‍යවහාරයට අනුව මෙය කටපයාදී ක්‍රමයයි. කටපය ක්‍රමය තුළ ' **ක** ' වර්ගය ආදී සිංහල හෝඩියේ ව්‍යඤ්ජන අක්ෂර 34 භාවිතා කර ඇත.

තල්පතෙහි දිනය සටහන් කිරීමට මෙම අංකන ක්‍රමවේදය භාවිතා කර ඇත.

13 වැනි සියවසේ සිට මෑත කාලය දක්වාම ලංකාවේ පුස්කොල පොත් අංකනය කිරීම් පිළිබඳ සාධක හමුවෙයි. නූතන රෝම අරාබි ඉලක්කම් භාවිතය සමඟ තල්පතෙහි අක්ෂර අංකන ක්‍රමවේදයෙහි සුළු වෙනස්කම් ඇති වෙමින් පවතියි. 19 වැනි සියවසට අයත් ඇතැම් ප්‍රශස්ති සඳහන් පුස්කොල පොත්හි වර්ෂ ක්‍රමය හින්දු අරාබි ඉලක්කම් මත පදනම්ව ඇත.(1,2,3) නමුත් පිටු අංකන ක්‍රමවේදය වෙනස් වී නොමැත. එනම් පිටුවෙහි අංක සටහන් කරන ස්ථානය නොවෙනස්ව පවතියි. මේ අනුව පැරණි අංකන ක්‍රමවේදය, අංක භාවිතයෙහි පවතින වෙනස්කම් සහිතව නූතනයේ ද ශේෂව පවතියි.

### ආශ්‍රිත ග්‍රන්ථ


දොරකුඹුර, ඩබ්.බී., වික්‍රමගේ, චන්ද්‍රා. (1996)*මැදගොඩ සුමනතිස්ස නාහිමිඅභිස්තව.* මහරගම: තරංජී ප්‍රින්ටර්ස්.

ලගමුව, ආරිය. (2006)*ශ්‍රී ලංකාවේ පුස්කොල පොත්ලේඛන කලාව.*අතුරුගිරිය: අමිල ප්‍රින්ටර්ස්.

සිරිවර්ධන, අශෝකා ශ්‍රියාණි. (2012)*ශ්‍රී ලංකාවේ පැරණි සන්නිවේදනය හා පොත්ගුල.*අනුරාධපුරය: කතෘ ප්‍රකාශන.